**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**ඉතිහාසය**

මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව අධ්‍යාපන කලාපය

විභාග අංකය / නම :.......................................................................................................

| | | |
|---|---|---|
| **8 ශ්‍රේණිය** | **I හා II පත්‍රය** | **කාලය පැය 02** |

**I කොටස**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මහ වැව් තැනීමේ ආරම්භක රජතුමා වන්නේ ,
 1. වසභ  2. මහසෙන්  3. ධාතුසේන  4. වළගම්බා

02. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට ප්‍රධාන හේතුව වන්නේ,
 1. වසංගත රෝග පැතිරී යාම  2. කාලිංග මාඝ ආක්‍රමණය
 3. අභ්‍යන්තර බල අරගලය  4. රටේ ආර්ථික පරිහාණිය

03. වැවක අතිරික්ත ජලය පිට කිරීම සඳහා නිර්මාණය කර ඇති අංගය වන්නේ ,
 1. රළපනාව  2. පිටවාන  3. බිසෝකොටුව  4. සොරොව්ව

04. කලා වැවේ සිට අනුරාධපුරයේ තිසා වැවට ජලය ගෙන යාමට ඉදිකළ ඇළ මාර්ගය කුමක්ද?
 1. යෝධ ඇළ  2. ඇළහැර ඇළ  3. තල්වතු ඇළ  4. මිණිපේ ඇළ

05. ලෝහ වැඩ කරන්නන් හා බෙලෙක් වැඩ කරන්නන් අතීතයේ හැඳින්වූ නම් පිළිවෙලින්,
 1. තඹර හා කබර  2. කබර හා තඹර
 3. තොපප හා තඹර  4. කබර හා තොපප

06. අනුරාධපුර යුගයේ ඉදිවූ දාගැබ් පමණක් ඇති පිළිතුර වන්නේ ,
 1. ථූපාරාමය , මිරිසවැටිය , අභයගිරිය
 2. මිරිසවැටිය , අභයගිරිය , දෙමළ මහා සෑය
 3. දැදිගම කොටවෙහෙර , ථූපාරාමය , මිරිසවැටිය
 4. රුවන්වැලි මහා සෑය , ජේතවනය , දෙමළ මහා සෑය

07. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා කවුද ?
 1. ජෝතිය සිටුවරයා රජතුමා  2. මායාදුන්නේ කුමරු රජතුමා
 3. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා  4. ජයවීර බණ්ඩාර රජතුමා

08. කෝට්ටේ රාජධානිය කෝට්ටේ , රයිගම හා සීතාවක වශයෙන් කොටස් තුනකට බෙදී ගියේ මින් කුමන රජතුමා උඩරට පාලනය කරන විටදීද?
 1. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා  2. පළවැනි රාජසිංහ රජතුමා
 3. පළවැනි විමලධර්මසූරිය රජතුමා  4. ජයවීර බණ්ඩාර රජතුමා

09. ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රජතුමා වන්නේ.

1. ශ්‍රී විජය රාජසිංහ රජතුමා 2. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

3. රාජාධිරාජසිංහ රජතුමා 4. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

10. 1453 වර්ෂයේදී ඉස්ලාම් භක්තික තුර්කිවරුන් අල්ලාගත් වෙළඳ නගරය වන්නේ ,

1. වැනීසිය 2. ජිනෝවා 3. කොන්ස්තන්තිනෝපලය 4. ජෙරුසලම

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවරදි පිළිතුර ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න**

11. පුනරුද සමයේදී ජර්මන් ජාතික ජොහැන්නස් ගුටෙන්බර්ග් -------------------- නිපදවීය.

12. පුනරුද සමයේදී මානවයාගේ කටයුතු පිළිබඳව වැඩිවශයෙන් හැදෑරීම නිසා සියල්ලට වඩා දෙවියන් උතුම් යන දේවවරම්වාදී සංකල්පය බිඳ දමමින් ------------------ යන සංකල්පය ප්‍රචලිත විය.

13. පියෙටා ප්‍රතිමාව , ඩේවිඩ්ගේ ප්‍රතිමාව මෙන්ම මෝසෙස්ගේ ප්‍රතිමාව නිර්මාණය කළ අග්‍රගණ්‍ය මූර්ති ශිල්පියා වන්නේ -----------------ය.

14. තාරකා විද්‍යාවේ පියා ------------------- වේ.

15. දුරදක්නය නිපදවූයේ ඉතාලි ජාතික ----------------- ය.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණද , වැරදි නම් (✕) ලකුණ ද යොදන්න**

16. දළදා මාළිගයට චිත්තාකර්ශනීය පත්තිරිප්පුව එක් කළේ ශ්‍රී විජය රාජසිංහ රජතුමාය. ( )

17. ලාක්ෂා , පන් වැනි දේශීය කර්මාන්ත උඩරට රාජ්‍යයේ දියුණුව පැවතිණි. ( )

18. විශිෂ්ට ලී කැටයම් නිර්මාණ රැසක් ඇම්බැක්කේ දේවාලයෙන් දැකගත හැකිය. ( )

19. වැනීසිය , ජිනෝවා යන නගර මධ්‍යතන යුගය අවසාන කාලය වන විට දියුණුව පැවති වෙළඳ නගර වේ. ( )

20. පුනරුද සමයේ කලා ශිල්ප වැඩි වශයෙන් ආගමික මුහුණුවරක් ගෙන ඇත. ( )

(ලකුණු 20X 2=40)

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- ❖ අනෙකුත් ප්‍රශ්න අතුරෙන් කැමති ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

---

(01.)

( අ ) ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න




(i) A , E හා F අක්ෂරවලින් දැක්වෙන පැරණි රාජධානි නම් කරන්න.

(ii) B අක්ෂරයෙන් පෙන්වා ඇති වරාය කුමක්ද?

(iii) B අක්ෂරයෙන් පෙන්වා ඇති වරාය අතීතයේ හැඳින්වූ නම කුමක්ද?

(iv) D අක්ෂරයෙන් පෙන්වන ගංගාව කුමක්ද?

(v) B හා C අක්ෂරවලින් පෙන්වා ඇති ස්ථානවලින් මුහුදට වැටෙන ගංගා මොනවාද? (ලකුණු 08)

( ආ )



a) මෙය කුමක්ද?

b) මෙහි සගවා තිබුණේ කුමක්ද?

c) මෙහි සගවා තැන්පත් කර තිබූ දෙය ඉන් පසුව ගෙන ගියේ කුමන රාජධානියකට ද?

d) එම කටයුතු සිදුකළ රජතුමා කවුද ? (ලකුණු 04)

( ඇ)



a) මෙම රජතුමා කවු ද?

b) මොහු කුමන වංශිකයෙක්ද?

c) මෙතුමා රාජ්‍යත්වයට පත්වූයේ වයස අවුරුදු කීයේදී ද?

d) මෙම රජතුමාගෙන් ඉටුවූ එක් සේවාවක් ලියන්න.

(ලකුණු 04)

(02.)

(i) වාරි කර්මාන්තයේ දියුණුවට කටයුතු කළ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(ii) අපේ මුතුන් මිත්තන් ඇළ මාර්ග ඉදිකිරීමෙන් ලබාගත් ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(iii) අතීතයේ ඉදිකළ පොකුණු වර්ග දෙකක් නම් කර ඉන් එක වර්ගයක් පිළිබඳ නිදසුන් සහිත කෙටි විස්තරයක් කරන්න.

(03.)

(i) අතීත ආරෝග්‍ය ශාලා පැවති බවට සාක්ෂි හමුවන ස්ථාන දෙකක් නම් කරන්න

(ii) මැටි කර්මාන්තය ඇසුරින් කළ නිර්මාණ වර්ග හතරක් දක්වන්න.

(iii) පැරණි ආගමික ගොඩනැගිලි දෙකක් දක්වා ඒ පිළිබඳ නිදසුන් සහිත කෙටි විස්තරයක් ලියන්න

(04.)

(i) මහනුවර රාජධානියට ස්වභාවික ආරක්ෂාව ලැබුණු ආකාර දෙකක් දක්වන්න.

(ii) උඩරට රජවරු මෙහෙයවූ පෘතුගීසි විරෝධී සටන් දෙකක් නම් කරන්න.

(iii) පළවැනි විමලධර්මසූරිය රජතුමාගෙන් ඉටුවූ සේවාව නිදසුන් දෙකක් දෙමින් කෙටියෙන් විස්තර කරන්න.

(05.)

(i) උඩරට රාජධානි සමයේ හේන්වල වගා කළ බෝග වර්ග දෙකක් නම් කරන්න.

(ii) උඩරට රාජධානි යුගයේදී ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය හතරක් නම් කරන්න.

(iii) මහනුවර යුගයේ චිත්‍ර කලාවේ දක්නට ඇති විශේෂතා තුනක් දක්වා නිදසුන් සමග කෙටියෙන් පැහැදිලි කරන්න.

(06.)

(i) පුනරුද සමයේ දියුණුවට පත් වූ ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න

(ii) පහත නිර්මාණ බිහිකළ ශිල්පීන් කවුදැයි දක්වන්න.

a අන්තිම රාත්‍රී භෝජනය

b අවසාන විනිශ්චය

c සාන්ත ජෝන්ගේ ප්‍රතිමාව

d මොනාලිසා

(iii) පුනරුද සමයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුව පිළිබඳ නිදසුන් සහිත විස්තරයක් කරන්න

(07.)

(i) පුනරුද සමයේ බිහි වූ ගත් කතුවරුන් දෙදෙනෙක් නම් කරන්න. **(ලකුණු 02)**

(ii) පහත සඳහන් සොයා ගැනීම් කළ විද්‍යාඥයින් කවුරුන්දැයි ලියන්න.

a. පෘථිවිය ගෝලාකාර බව හා අනෙකුත් ග්‍රහ වස්තු සූර්යයා වටා පරිභ්‍රමණය වන බව.

b. දුර දක්නය **(ලකුණු 04)**

(iii) පුනරුද සමයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. **(ලකුණු 05)**